**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
**කොළඹ**
**මාධ්‍ය නිවේදනය**

**Public Affairs Section**
**Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070**
**Email: VanHornNT@state.gov ● http://lk.usembassy.gov**

**Release No. 20180813**

**ඉන්දු පැසිෆික් අරමුදල් නිවේදනය**

**අගොස්තු 13 කොළඹදීය:** ශ්‍රී ලංකාවට ආසන්න වශයෙන් ඩොලර් මිලියන 39 ක් විදේශීය හමුදා සඳහා මූල්‍යයමය ආධාර වැඩ සටහන යටතේ ලබා දීමට කටයුතු කරන බව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව සතුටින් නිවේදනය කරනු ලබයි. මේ සඳහා කොංග්‍රස් සභාවේ අනුමැතිය ලැබීමට නියමිතය.

මෙසේ ලබාදෙන ආධාර බෙංගාල බොක්කේ ආරක්ෂාව සඳහා වූ ක්‍රියාකාරකම් සහ මානුෂීය සේවා සැලසීම හා ආපදා සහන සැලසීම යනාදී ක්ෂේත්‍රයන් සඳහා යොදාගන්නේ කෙසේද යන්න පිළිබඳව අපි ශ්‍රී ලංකාවේ රජයත් සමගින් සාකච්ඡා කිරීමට අපේක්ෂාවෙන් සිටිනවා.

*එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිකා හීදර් නොයෙට් මේ සම්බන්ධයෙන් 2018 අගෝස්තු 7වැනි දින දැක්වූ අදහස්*

“ලේකම්වරයා පසුගිය සතියේදී ද්විපාර්ශවික සහ බහුපාර්ශවික සාකච්චා සඳහා ඉන්දුනීසියාවට, මලයාසියාවට හා සිංගප්පූරුව යන රටවල චාරිකා සිදුකළ අතර මෙහිදී එක්සත් ජනපදයේ සහ මෙම කළාපයේ ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා නීත්‍යානුකූල මෙහෙයුම් සඳහා සහාය ලබාදීම, මිතුරු පාර්ශවයන් සහ අප හා සන්ධාන ගතවූවන් සහාය දක්වීමට අපගේ පවත්නා කැපවීම සහ ඉන්දු පැසිෆික් කළාපයේ ආරක්ෂාව වෙනුවෙන් සක්‍රීයව සම්බන්ධවී සිටීම විදහා දැක්වීම අවධාරණය කිරීම මෙම සාකච්ඡාවේ අරමුණු විය. සිංගප්පූරුවේදී ලේකම්වරයා ඉන්දු පැසිෆික් උපාය මාර්ගික සැළැස්මේ ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කළ අතර දකුණු සහ ගිණිකොණ දිග ආසියා කළාපය සඳහා ඩොලර් මිලියන 300 ක් වෙන් කර තිබෙන බව ප්‍රකාශයට පත් කළේය. මේ සම්බන්ධයෙන් ප්‍රශ්න රාශියක් අපට ඇතිවී තිබෙනවා එමනිසා මේ වැඩසටහන යටතේ අප සම්බන්ධවන අංශ සමහරක් පිළිබඳව අවධාරණ කිරීමට මට අවශ්‍යයි. මේ සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් ඇතිවී තිබෙනවා” යනුවෙන් සඳහන් කළේය.

”මෙම අරමුදල් සැපයීම මගින් බංග්ලාදේශය, ඉන්දුනීසියාව, මොන්ගෝලියාව, නේපාලය, පැසිෆික් දිවයින, පිලිපීනය, ශ්‍රී ලංකාව, වියට්නාමය සහ අනෙකුත් රටවල් සමග අප පවත්වාගෙන යන ආරක්ෂාව

සම්බන්ධ ක්‍රියාමාර්ග සඳහා අපගේ ආයෝජන කැපීපෙනෙන ලෙස වැඩිවනවා. මෙම ආයෝජන මගින් පැසිෆික් කළාපයේ ප්‍රධාන ක්ෂේත්‍රයන් සතරක් සම්බන්ධයෙන් නිදහස් විවෘත සහ නීතිය පදනම්කරගත් ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කිරීම පිළිබඳ අවධානය යොමු කරනවා. මේවාට සමුද්‍රීය ආරක්ෂාව, මානුෂීය සහන සැලසීම ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සහ සාමය පවත්වාගෙන යාමේ ධාරිතාවන් හා රටවල් අතර සිදුවන්නා වූ අපරාධයන් වැළැක්වීම අයත් වෙනවා. සමුද්‍රීය ආරක්ෂණ තේමාව යටතේ එක් අංගයක් ලෙස ඉන්දියානු සාගරය නැගෙනහිර ආසියාව හා සම්බන්ධ කරන්නාවූ වැදගත් මුහුදු මාර්ග වැටී තිබෙන ඉන්දීය සාගරය කලාපයේ ජනතාවගේ සහ හමුදාවන් හි ධාරිතාවන් වැඩකිරීමේ අරමුණින් අප බෙංගාල බොක්කේ වැඩසටහන ආරම්භ කරනු ලැබුවා.”